# දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
# Distance and Continuing Education Unit – University of Ruhuna

## ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු
## First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

### සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය
### SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකිය**

---

01. සිදත් සඟරා අක්ෂර මාලාවෙහි හා ශුද්ධ සිංහල අක්ෂර මාලාවෙහි සමවිෂමතා සංසන්දනාත්මකව විස්තර කරන්න.

02. පහත දැක්වෙන ගීයේ අදහස පැහැදිලි කර, අන්‍යාර්ථ සමාසය (අන් අරුත් සමස්) උදාහරණ මගින් පැහැදිලි කරන්න.

 "කියොලත අන් අරුත් - පදනත් අනෙ වැසියේ
 එසමස් අන් අරුත් නම් - එහි බේ සත් විබතැ වේ"

03. විභක්ති යනු කුමක් ද යි පැහැදිලි කොට, කර්ම විභක්තිය හා එහි ප්‍රයෝග සනිදර්ශනව පහදන්න.

04. "පියවි දෙවැදෑරුම් දා පියවි සද පියවි වී" මේ අනුව භාෂා අධ්‍යයනයේ දී ප්‍රකෘති වැදගත් වන්නේ කෙසේ ද යි උදාහරණ සහිත ව විග්‍රහ කරන්න.

05. "දයින් නමින් හොත - කැරැ අරුතට නිසි පසන්
 සපයා සදන් පසරුත් - හිමි නොලැගැ ලොවැ වහරන්"

 මේ සිදත් සඟරා විග්‍රහය අනුව ප්‍රත්‍යාර්ථ නාම හඳුන්වා, කෘදන්ත නාම සනිදර්ශනව විග්‍රහ කරන්න.

06. පහත දැක්වෙන ව්‍යාකරණ මාතෘකාවලින් දෙකකට විස්තරාත්මක සටහන් ලියන්න.
 1. හකර විනිස
 2. උපසර්ග
 3. ප්‍රයෝජ්‍ය ක්‍රියා
 4. විධි ක්‍රියා

07. සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
 1. පියාණෝ දරුවන්ට ආදරය කරති.
 2. බොහෝ බෞද්ධයන් ශ්‍රී ලාංකිකයන් ලු.
 3. අගමැති හෙවත් ඇමති ධර්මශාලාව විවෘත කරන්නට පැමිණියේ ය.
 4. තිස්තුන් කෝටියක් දෙවියෝ රට වැසියන්ට පිහිට වෙති.
 5. ප්‍රකට මහාචාර්යවරයෙක් වූ සුනිල් ආරියරත්න දක්ෂ ගේය පද රචකයෙකු ද විය.
 6. ඔවුහු මම හා ගැටුම් ඇති කර ගනිති.
 7. ගොවියන් කුඹුරේ නැත.
 8. දූරියක් අඬනවා මම දුටුවෙමි.
 9. ගුරුවරයා ද මම ද නුඹ ද චාරිකාව ගියෙහි.
 10. තරු රැස අහස බබළවති.

08. පහත සඳහන් වාක්‍යයන්හි උපයුක්ත උක්තාඛ්‍යාත පද සම්බන්ධ රීති කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ඇතමෙක් දෙවියන් පුදති.
2. ඔහු ද මම ද පන්සල් යමු.
3. බල්ලන් බුරද්දී අපි එළියට බැස්සෙමු.
4. ගොවියෝ රැසක් පොහොර ඉල්ලා උද්ඝෝෂණය කරති.
5. දොස්තර මහතා හෙවත් අකිල මහතා රෝහලට පැමිණියේය.
6. ඔවුන් දේශනයට පැමිණ නැත.
7. සොරුන් සොරකම් කරති'යි ඔවුහු සිතූහ.
8. භික්ෂූන් දේශපාලනයට සම්බන්ධ වන්නේ ඇයි?
9. බල්ලෝ මිනිසුන් හා හාද වෙති.
10. නුඹ හෝ අයියා හෝ මම හෝ පාසලට යමි.

(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගිනි)

********************************************